**ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ තාක්ෂණික පුහුණුව වැඩි දියුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - 2018**

---

ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ තාක්ෂණික පුහුණුව වැඩි දියුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තාව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ඔස්ට්‍රියාවේ රයිෆිසන් බැංකුව අතර 2018 නොවැම්බර් 02 දින එළඹි අංක 2017025/SL දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

ණය ගිවිසුම අනුව, කර්මාන්ත හා වාණිජ කටයුතු, දිර්ඝ කාලීන අවතැන්වූවන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධනය සහ වෘත්තීය පුහුණු සහ නිපුණතා සංවර්ධනය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම් නියෝජිතායතනය වේ. ඉංජිනේරු තාක්ෂණ ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු විද්‍යා ඩිප්ලෝමාවේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1,983.60 කට සමාන යුරෝ මිලියන 9.5 ක් වන අතර ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඔස්ට්‍රියාවේ රයිෆිසන් බැංකුව මගින් මූල්‍යනය කිරීමට එකඟ වී ඇත. ව්‍යාපෘතියේ කටයුතු 2018 පෙබරවාරි මස ආරම්භ කර තිබුණු අතර, 2020 අප්‍රේල් මස වන විට නිම කිරීමට නියමිතය.

1.3 **මතය**

**------**

ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරන ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය වාර්තාව විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය වාර්තාව සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

---

මෙම මූල්‍ය වාර්තාව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය වාර්තා පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය වාර්තාව විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

---

සමස්තයක් ලෙස මූල්‍ය වාර්තාව, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ

වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය වාර්තාව පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය වාර්තාවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය වාර්තාවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය

------------------------

### 2.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

--------------------------------------------

සපයා තිබූ තොරතුරු ප්‍රකාරව, ව්‍යාපෘතිය මගින් ක්‍රියාත්මක කිරීමට නියමිත වූ නව රසායනාගාර උපකරණ මිලදී ගැනීම, කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සහ දැනට පවතින ගොඩනැගිලි පුනරුත්ථාපනය කිරීම සහ එම ආයතනය විසින් පවත්වනු ලබන පුහුණු විෂය නිර්දේශය වැඩි දියුණු කිරීම වැනි කටයුතු කර්මාන්තයේ වර්තමාන අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි ව්‍යාපෘතිය මඟින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාවලට අනුව, 2018 දෙසැම්බර් 31 වන විට නව ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සැලකිය යුතු ලෙස අවසන් කර ඇති අතර 2018 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට අපේක්ෂා කළ පවත්නා ගොඩනැගිල්ලේ පුනරුත්ථාපන කටයුතු වල භෞතික ප්‍රගතිය සියයට 40 ක මට්ටමක තිබුණි. කෙසේ වෙතත්, පුහුණු පාඨමාලා විෂය නිර්දේශය වැඩිදියුණු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග 2018 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භක අවධියේ පැවතුනි.